# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2134/45 – 2019 අගෝස්තු 01 වැනි බ්‍රහස්පතින්ද – 2019.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 146 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/16/2018/UDA/228.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KES/DS/LND/AC/8/5/15.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ජූලි මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කැස්බෑව.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 581E, මහල්වරාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මහල්වරාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KSB/2019/163 හා 2019.05.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලි වලට මායිම්:

01. **කැබලි අංක 1 – දෙනියවල – ප්‍රමාණය: හෙක්. 6.7550 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: ඇළ; දකුණට: බංගලාවත්ත ගම, ඇළ සහ ජය මාවත; බටහිරට: ජය මාවත සහ ඇළ.

08 - 595



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*